ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2026.01.20

පැමිණිලි පාර්ශවය : වී.ජී.ටී. ලක්ෂානි මිය,
51/8, 3වන පටුමඟ,
ගම්මාන පාර,
මහරගම.

වගඋත්තර පාර්ශවය : (1) විදුහල්පතිනිය,
විශාඛා විද්‍යාලය,
කොළඹ 05.

(2) අතිරේක ලේකම් (පාසල් කටයුතු),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**පැමිණිලි අංකය : HRC/2085/25**

**පැමිණිලිකාරියගේ පැමිණිල්ල:**

තමා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට අනුයුක්තව වසර 13ක කාලයක් සේවයේ යෙදෙන බවත්, ඒ අනුව තමාගේ දියණිය 2024 වර්ෂය සඳහා විශාඛා විද්‍යාලයේ 4 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට අවස්ථාව හිමි වූ බවත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාසල් කටයුතු) විසින් පැමිණිලිකාරියට ද පිටපතක් සහිතව අංක ED/01/06/16/4/AD/PD/2024 හා 2024.11.11 දිනැති ලිපිය විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය වෙත යොමු කරමින් පැමිණිලිකාරියගේ දියණිය විශාඛා විද්‍යාලයේ 4 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම අනුමත කර තිබියදී තමාගේ දියණිය හැර

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන තවත් නිලධාරීන් පිරිසකගේ දරුවන් 8දෙනෙක් විශාඛා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට කටයුතු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් විදුහල්පතිනියගෙන් විමසූ අවස්ථාවේදී තමාගේ දියණිය ඒ වන විට 5 ශ්‍රේණියට සමත්ව තිබීම හේතුවෙන් පාසලට ඇතුළත් කර ගැනීමේ හැකියාවක් නොමැති බවට දැන්වූ බවත්, අදාළ ලිපිය 2024.11.11 දිනැතිව නිකුත් කර තිබියදී විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය තමාගේ දියණිය පාසලට ඇතුළත් කර නොගෙන ප්‍රමාද කිරීම හේතුවෙන් මෙම තත්වය ඇති වූ බවත් පැමිණිලිකාරිය සඳහන් කර ඇත. ඒ අනුව තම දියණිය විශාඛා විද්‍යාලයට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම:**

විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අංක VV/DP02/අතරමැදි පංති/2025 හා 2025.08.15 දිනැති වාර්තාව සහ අංක VV/DP03/අතරමැදි පංති/2025 හා 2025.08.25 දිනැති වාර්තාව මඟින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

රාජ්‍ය සේවයේ නියුතු වෘත්තිකයන්ගේ දරුවන් ජාතික පාසල්වල අතරමැදි ශ්‍රේණිවලට ඇතුළත් කිරීමට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාසල් කටයුතු) විසින් පැමිණිලිකාරියට ද පිටපතක් සහිතව ඇයගේ දියණිය වන ජේ.කේ.එස්. සඳුත්මි ශිෂ්‍යාව 2024 වර්ෂය සඳහා විශාඛා විද්‍යාලයේ 4 ශ්‍රේණියට ඇතුළත් කිරීම අනුමත කරමින් අංක ED/01/06/16/4/AD/PD/2024 හා 2024.11.11 දිනැති ලිපිය සහ එවැනිම තවත් ලිපි 8ක් (2 ශ්‍රේණිය සඳහා ශිෂ්‍යාවන් 6දෙනෙක්, 3 ශ්‍රේණිය සඳහා ශිෂ්‍යාවන් දෙදෙනෙක්) විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය වෙත යොමු කර ඇත. එකී ලිපි විශාඛා විද්‍යාලය වෙත ලැබී ඇත්තේ 2024.11.18 දින ය.

ඒ වන විට අතරමැදි ශ්‍රේණිවල සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්මවා තිබූ බැවින් ගත යුතු ඉදිරි පියවර පිළිබඳව අවස්ථා කිහිපයකදී අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) වෙතින් උපදෙස් විමසූ බවත්, ඒ අනුව පාසලේ ඉඩකඩ ඇත්නම් පමණක් බඳවා ගන්නා ලෙස දැනුම්දුන් බවත්, 2024.11.23 දින සිට 2025.01.01 දින දක්වා පාසල් නිවාඩු කාලය පැවති බැවින් 2025 වර්ෂයේ ජනවාරි මාසයේ මුල් සතිය තුළ ජාතික පාසල් අධ්‍යක්ෂ වෙතින් දුරකථනය ඔස්සේ උපදෙස් පැතූ නමුත් එහිදී ද තීරණයකට එළඹීමට නොහැකි වූ බැවින් අතිරේක ලේකම් (පාසල් කටයුතු) හා අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) වෙත පිටපත් සහිතව විදුහල්පතිනිය විසින් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පතා 2025.01.21 දිනැතිව ලිපියක් යොමු කර ඇති බවත් උක්ත වාර්තා මඟින් වැඩිදුරටත් දක්වා ඇත.

එම ලිපියට පිළිතුරු ලෙස අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්)ගේ අංක ED/01/06/16/3/Admission/2024(පොදු) හා 2025.01.23 දිනැති ලිපිය මඟින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කළ ලිපි නිවැරදි බව පමණක් තහවුරු කර ඇත.

තවද පැමිණිලිකාරියට ද පිටපතක් සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාසල් කටයුතු) විසින් විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය වෙත යොමු කර ඇති අංක ED/01/06/16/4/AD/PD/2024 හා 2024.11.11 දිනැති ලිපිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් විමසූ අවස්ථාවේදී, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) විසින් "චක්‍රලේඛ අංක 17/2023 හි 6.0 වගන්තිය යටතේ අධ්‍යාපන ලේකම් විසින් අනුමත කර ඇත. ගොනුව අනුව නිවැරදියි" යනුවෙන් සටහන් කරමින් 2025.01.28 දින පාසල වෙත යොමු කර ඇත.

ඒ වන විට නව අධ්‍යයන වර්ෂය ආරම්භ කර තිබූ බැවින් එම සිසුවියන් 9දෙනා 2024 වර්ෂයේ සඳහන් ශ්‍රේණිවලට ඇතුළත් කර ගැනීම පිළිබඳ ප්‍රායෝගිකව ගැටලුකාරී තත්ත්වයක් ඇතිව තිබූ බැවින් විදුහල්පතිනිය විසින් 2025.01.31 දිනැතිව නැවතත් උපදෙස් පතා අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) වෙත ලිපියක් යොමු කර ඇත.

මෙම ලිපිවලට අදාළව නිවැරදි උපදෙසක් ලැබුණේ අතිරේක ලේකම් (පාසල් කටයුතු)ගේ අංක ED/01/06/16/13/AD/MOE/2024 හා 2025.02.13 දිනැති ලිපියෙන් බවත්, ඒ අනුව සිසුවියන් 8දෙනෙකු 2024 වර්ෂයේ ඉගෙනුම ලැබූ ශ්‍රේණියට ඉහල පන්තියට ඇතුළත් කිරීමට කටයුතු කළ බවත්, පැමිණිලිකාරියගේ දියණිය වන ජේ.කේ.එස්. සඳුත්මි ශිෂ්‍යාව එම අවස්ථාව වන විට 4 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණියට සමත්ව තිබූ බවත්, අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 17/2023 දරණ චක්‍රලේඛයේ 3.6 වගන්තිය ප්‍රකාරව 5 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමට අවස්ථාව සලසා නොමැති බැවින් එම දියණිය විශාඛා විද්‍යාලයට ඇතුළත් කරගෙන නොමැති බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු:**

මෙම පැමිණිල්ලට අදාළ පරීක්ෂණ කටයුතු 2025.08.20 සහ 2025.10.02 යන දිනවල සිදුකරන ලදී. 2025.08.20 දින පවත්වන ලද පරීක්ෂණය සඳහා විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය නියෝජනය කරමින් නියෝජ්‍ය විදුහල්පති, බී.ඩබ්ලිව්.පී. රත්නසිරි මහත්මිය සහ නීතිඥ ක්‍රිෂෝ ජයරත්න මහතා සහභාගී විය. එහිදී ඉහත වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම යටතේ සඳහන් කර ඇති කරුණු නැවත වරක් ඉදිරිපත් විය.

නැවත මෙම පැමිණිල්ලට අදාළ පරීක්ෂණ කටයුතු 2025.10.02 දින කැඳවන ලද අවස්ථාවේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාසල් කටයුතු) වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) එම්.සී. පලාවෙල මහත්මිය සඳහන් කර සිටියේ, 2024.11.11 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලිපියක් නිකුත් කරමින් පැමිණිලිකාරියගේ දියණිය 2024 වර්ෂයේ විශාඛා විද්‍යාලයේ 04 ශ්‍රේණිය සඳහා ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙස විදුහල්පතිනිය වෙත දන්වා ඇති බවත්, මෙම ඇතුළත් කිරීම සිදු කිරීමට පෙර අනුමත ලිපියේ පිටපතක් ජාතික පාසල් ශාඛාවේ ෆැක්ස් අංකයට යොමු කර ලිපියේ නිරවද්‍යතාවය තහවුරු කර ගන්නා ලෙස එම ලිපිය මඟින් වැඩිදුරටත් දන්වා

ඇති බවත්, ඒ අනුව විශාඛා විද්‍යාලයට ඇතුළත් කරගන්නා ලෙස දන්වා ඇති අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් 09 දෙනෙකුගේ දරුවන්ට අදාළ අනුමත ලිපි ජාතික පාසල් ශාඛාව විසින් අතින් රැගෙන ගොස් භාර දී ඇති බව ගොනුව අනුව නිරීක්ෂණය වන බවත් ය. ඒ අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අතරමැදි ශ්‍රේණි සඳහා ළමුන් ඇතුළත් කිරීමේ ලිපිය නිකුත් කිරීමෙන් පසු සිදු කරන ක්‍රියාවලිය ඉහත ආකාරය වන බවත් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

කෙසේනමුත් ඒ වන විට ක්‍රියාත්මකව තිබූ අංක 17/2023 චක්‍රලේඛයේ 3.6 වගන්තිය අනුව, ආසන්න අවුරුදු 03 ක් ඇතුළත 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත අවම ලකුණු තීරණය වූ 6 ශ්‍රේණියට ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරනු ලබන පාසල්වල 5 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම කිසිසේත්ම නොකළ යුතු බැවින් සහ 17/2023 චක්‍රලේඛයේඛ 6.0 වගන්තිය අනුව පැමිණිලිකාරියගේ දියණිය විශාඛා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට අදාළ ලිපිය නිකුත් කර ඇති බැවින් 5 ශ්‍රේණිය සඳහා දරුවා ඇතුළත් කිරීම සඳහා පවතින චක්‍රලේඛ විධිවිධාන අනුව එකඟතාවය පළ කළ නොහැකි බවට සඳහන් කරන ලදී.

එසේම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2025.09.09 දිනැතිව අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක 27/2025 දරණ චක්‍රලේඛය මගින් පෙර කී සියළු චක්‍රලේඛ අවලංගු කර ඇති බවත්, මෙම වසරේ සිට පුරප්පාඩු මත පමණක් අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම සිදු කරනු ලබන බවත් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

**නිරීක්ෂණ:**

1. තමා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට අනුයුක්තව වසර 13ක කාලයක් සේවයේ යෙදෙන බවත්, ඒ අනුව තමාගේ දියණිය 2024 වර්ෂය සඳහා විශාඛා විද්‍යාලයේ 4 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට අවස්ථාව හිමි වූ බවත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාසල් කටයුතු) විසින් පැමිණිලිකාරියට ද පිටපතක් සහිතව අංක ED/01/06/16/4/AD/PD/2024 හා 2024.11.11 දිනැති ලිපිය විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය වෙත යොමු කරමින් පැමිණිලිකාරියගේ දියණිය විශාඛා විද්‍යාලයේ 4 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම අනුමත කර තිබියදී තමාගේ දියණිය හැර අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන තවත් නිලධාරීන් පිරිසකගේ දරුවන් 8දෙනෙක් විශාඛා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට කටයුතු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් විදුහල්පතිනියගෙන් විමසූ අවස්ථාවේදී තමාගේ දියණිය ඒ වන විට 5 ශ්‍රේණියට සමත්ව තිබීම හේතුවෙන් පාසලට ඇතුළත් කර ගැනීමේ හැකියාවක් නොමැති බවට දැන්වූ බවත් පැමිණිලිකාරිය තම පැමිණිල්ල මගින් සඳහන් කර ඇත. අදාළ ලිපිය 2024.11.11 දිනැතිව නිකුත් කර තිබියදී විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය තමාගේ දියණිය පාසලට ඇතුළත් කර නොගෙන ප්‍රමාද කිරීම හේතුවෙන් මෙම තත්වය ඇති වූ බැවින් තම දියණිය විශාඛා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත.

2. පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 17/2023 චක්‍රලේඛයේ 6.0 වගන්තිය අනුව, අධිකරණ තීන්දු හා අනෙකුත් නෛතික ක්‍රියාමාර්ගවලට අනුකූලව නියම කෙරෙන සිසුන් ඇතුළත් කිරීම මෙන්ම චක්‍රලේඛයෙන් ආවරණය නොවන යම් විශේෂ හේතුවක් මත ශිෂ්‍යයෙකුගේ දැනට ඉගෙනුම ලබන පාසල වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් ශිෂ්‍යයාගේ අධ්‍යාපන අවස්ථාව තහවුරු වන පරිදි අවස්ථානුකූලව තීරණ ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු බව දක්වා ඇත. එම වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාසල් කටයුතු) විසින් අමාත්‍යාංශ ලේකම් වෙනුවට අත්සන් තබමින් පැමිණිලිකාරියට ද පිටපතක් සහිතව ඇයගේ දියණිය වන ජේ.කේ.එස්. සඳුත්මි ශිෂ්‍යාව 2024 වර්ෂය සඳහා විශාඛා විද්‍යාලයේ 4 ශ්‍රේණියට ඇතුළත් කිරීම අනුමත කරමින් අංක ED/01/06/16/4/AD/PD/2024 හා 2024.11.11 දිනැති ලිපිය සහ එවැනිම තවත් ලිපි 8ක් (2 ශ්‍රේණිය සඳහා ශිෂ්‍යාවන් 6දෙනෙක්, 3 ශ්‍රේණිය සඳහා ශිෂ්‍යාවන් දෙදෙනෙක්) විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය වෙත යොමු කර ඇත. එකී ලිපි විශාඛා විද්‍යාලය වෙත ලැබී ඇත්තේ 2024.11.18 දින ය. එකී ලිපියේ දක්වා ඇත්තේ දරුවා ඇතුළත් කිරීමට පෙර අනුමත ලිපියේ පිටපතක් 0112785643 ෆැක්ස් අංකයට යොමු කර ලිපියේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙසයි.

3. එම ලිපි 2024.11.18 දින වන විට පාසලට ලැබී ඇතත් ඒ වන විට අතරමැදි ශ්‍රේණිවල සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්මවා තිබූ බැවින් එම ලිපි සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි පියවර පිළිබඳව උපදෙස් පතා අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් පළමුවරට ලිඛිතව විමසීමක් සිදුකර ඇත්තේ 2025.01.21 දිනය. එනම් අදාළ ලිපි පාසල වෙත ලැබී මාස 2කට ආසන්න කාලයක් ගත වීමෙන් පසුව ය.

4. එම ලිපියට පිළිතුරු ලෙස අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්)ගේ අංක ED/01/06/16/3/Admission/2024(පොදු) හා 2025.01.23 දිනැති ලිපිය මඟින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කළ ලිපි නිවැරදි බව පමණක් තහවුරු කර ඇත. තවද පැමිණිලිකාරියට ද පිටපතක් සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාසල් කටයුතු) විසින් විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය වෙත යොමු කර ඇති අංක ED/01/06/16/4/AD/PD/2024 හා 2024.11.11 දිනැති ලිපිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් විමසූ අවස්ථාවේදී, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) විසින් “චක්‍රලේඛ අංක 17/2023 හි 6.0 වගන්තිය යටතේ අධ්‍යාපන ලේකම් විසින් අනුමත කර ඇත. ගොනුව අනුව නිවැරදියි” යනුවෙන් පමණක් සටහන් කරමින් 2025.01.28 දින පාසල වෙත යොමු කර ඇති බවත්, කෙසේනමුත් ඒ වන විට නව අධ්‍යයන වර්ෂය ආරම්භ කර තිබූ බැවින් එම සිසුවියන් 9දෙනා 2024 වර්ෂයේ සඳහන් ශ්‍රේණිවලට ඇතුළත් කර ගැනීම පිළිබඳ

ප්‍රායෝගිකව ගැටලුකාරී තත්ත්වයක් ඇතිව තිබූ බැවින් විදුහල්පතිනිය විසින් 2025.01.31 දිනැතිව නැවතත් උපදෙස් පතා අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) වෙත ලිපියක් යොමු කර ඇත.

5. වගඋත්තර පාසල විසින් ඉදිරිපත් කර ඇති කරුණුවලට අනුව, මෙම ලිපිවලට අදාළව නිවැරදි උපදෙසක් ලැබී ඇත්තේ, අතිරේක ලේකම් (පාසල් කටයුතු)ගේ අංක ED/01/06/16/13/AD/MOE/2024 හා 2025.02.13 දිනැති ලිපියෙනි. ඒ අනුව සිසුවියන් 8දෙනෙකු 2024 වර්ෂයේ ඉගෙනුම ලැබූ ශ්‍රේණියට ඉහල පන්තියට ඇතුළත් කිරීමට කටයුතු කර ඇති අතර, පැමිණිලිකාරියගේ දියණිය වන ජේ.කේ.එස්. සඳුත්මි ශිෂ්‍යාව එම අවස්ථාව වන විට 4 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණියට සමත්ව තිබී ඇත. අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 17/2023 දරණ චක්‍රලේඛයේ 3.6 වගන්තිය ප්‍රකාරව 5 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමට අවස්ථාව සලසා නොමැති බැවින් එම දියණිය විශාඛා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට නොහැකි වූ බවට වගඋත්තර පාර්ශවය විසින් කරුණු දක්වා ඇත.

6. කෙසේනමුත් අතිරේක ලේකම් (පාසල් කටයුතු) විසින් විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය අමතමින් යොමු කරන ලද අංක ED/01/06/16/13/AD/MOE/2024 හා 2025.02.13 දිනැති ලිපියෙහි සඳහන් කර ඇත්තේ, "ඔබ විසින් විමසා ඇති කරුණු සඳහා මින් පෙර ඔබ විසින් යොමු කරන ලද ඔබේ අංක VV/01/ORD-2025 හා 2025.01.21 දිනැති ලිපිය සඳහා මාගේ අංක ED/01/06/16/3/Admission/2024(පොදු) හා 2025.01.23 දිනැති ලිපියෙන් පිළිතුරු ලබා දී ඇත" යනුවෙනි. ඒ අනුව වගඋත්තර පාසල විසින් 2025.02.13 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් යොමු කළ ලිපිය මඟින් නිවැරදි උපදෙසක් ලැබුණු බවට ප්‍රකාශ කරන නමුත් එම ලිපිය මඟින් 2025.01.23 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් යොමු කරන ලද ලිපියේ කරුණු නැවත වරක් තහවුරු කිරීම පමණක් සිදුව ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව එකම කරුණක් සම්බන්ධයෙන් කිහිප අවස්ථාවකදී අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් විමසීම් සිදුකර ඇති බවත්, එලෙස ලිපි හුවමාරුවීමේදී ප්‍රමාදයක් ඇතිව තිබෙන බවත් නිරීක්ෂණය වේ.

7. එම ප්‍රමාදය මෙම පැමිණිලිකාරියගේ හෝ ඇයගේ දියණියගේ පාලනයෙන් තොරව සිදුවූවක් වන බවට නිරීක්ෂණය වේ. තවද එකී ප්‍රමාදය හේතුවෙන් ජේ.කේ.එස්. සඳුත්මි ශිෂ්‍යාව 4 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණියට සමත්ව තිබීම මත පදනම්ව 17/2023 චක්‍රලේඛයේ විධිවිධානවලට යටත්ව එම දියණිය පමණක් පාසලට ඇතුළත් කර නොගැනීමත් අනෙක් ශිෂ්‍යාවන් 8දෙනා මෙම ලිපි නිකුත් කරන අවස්ථාව වන විට ඉගෙනුම ලබමින් සිටි ශ්‍රේණිවලට ඉහල ශ්‍රේණි සඳහා ඇතුළත් කිරීමට කටයුතු කිරීමත් මඟින් පැමිණිලි පාර්ශවයට අගතියක් සිදුව ඇති බව නිරීක්ෂණය වේ. එමෙන්ම අදාළ ශිෂ්‍යාවන් පාසලට ඇතුළත් කර ගැනීම මුල්වරට ප්‍රතික්ෂේප කර ඇත්තේ, පුරප්පාඩු නොමැති වීම හේතුවෙන් බවට වගඋත්තර පාසල විසින් සඳහන් කර

ඇති නමුත් පසුව එම ශිෂ්‍යාවන් අතරින් පැමිණිලිකාරියගේ දරුවා හැර අනෙක් දරුවන් 8දෙනාම ඇතුළත් කර ගැනීමට කටයුතු කිරීම ද ගැටලු සහගත බව නිරීක්ෂණය වේ.

8. මෙ වන විට අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 27/2025 අංක දරන නව චක්‍රලේඛය නිකුත්කර ඇති නමුත් මෙම ප්‍රශ්නගත සිදුවීම සිදුවන අවස්ථාව වන විට ක්‍රියාත්මක වූයේ අංක 17/2023 දරණ පැරණි චක්‍රලේඛය වන බැවින් නව චක්‍රලේඛයේ විධිවිධාන මෙම සිදුවීම සම්බන්ධයෙන් අදාළ කර ගැනීම සුදුසු නොවන බවද නිරීක්ෂණය වේ.

**නිගමනය:**

ඉහත නිරීක්ෂණවලට අනුව, පැමිණිලිකාරියගේ දියණිය ඇතුළු සිසුවියන් 9දෙනෙක් විශාඛා විද්‍යාලයට ඇතුළත් කර ගන්නා ලෙස දැනුම්දෙමින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය වෙත යොමු කළ ලිපි ලැබුණු වහාම ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම තුළ සිදුවූ ප්‍රමාදය මත ජේ.කේ.එස්. සඳුත්මි ශිෂ්‍යාව 4 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණියට සමත්ව ඇත. ඒ අනුව, අංක 17/2023 දරණ චක්‍රලේඛය ප්‍රකාරව ඇය 5 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය කටයුතු කර නොමැති නමුත් එකී ප්‍රමාදය පැමිණිලිකාරියගේ හෝ ඇයගේ දියණියගේ පාලනයෙන් තොර කරුණක් වන බැවින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම පැමිණිලිකාරිය සම්බන්ධයෙන් පළමු වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 27/2025 දරණ නව චක්‍රලේඛය මඟින් පාසල්වල 5 සහ 6 ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති බැවින් පැමිණිලිකාරියගේ දියණිය 7 ශ්‍රේණියට සමත් වීමෙන් අනතුරුව විශාඛා විද්‍යාලයේ 7 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා වගඋත්තර පාර්ශවය පියවර ගත යුතුය.

පැමිණිලිකාරියගේ දියණිය 7 ශ්‍රේණියට සමත් වූ වහාම මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ අදාළ නිර්දේශය ක්‍රියාත්මක කර තිබේද නැද්ද යන්න පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් -: (1) අමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - කාරුණික දැනගැනීම සඳහා

(2) ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - අවශ්‍ය පියවර ගැනීම සඳහා

(3) අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්), අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - අවශ්‍ය පියවර ගැනීම සඳහා